# 1 පරිච්ඡේදය

# කතිකාවත්වල ප්‍රභවය සහ විකාශය

කතිකාවත් යන වචනය සහ කතිකාවත් නමින් හැඳින්වෙන කෘති පිළිබඳ ඓතිහාසික විමර්ශනයක් මෙම පරිච්ඡේදයට ඇතුළත් වෙයි. කතිකාවත් ශබ්දය පාළි **කතිකවත්ත** යන්න සමගත් ඊට තැකම් ඇති පාළි **කතිකා** සහ **කතිකසණ්ඨාන** යන වචන සමගත් සසඳා බැලීම එහිලා ප්‍රයෝජනවත් වෙයි.

## 1 කතිකා

යම්කිසිවක් කිරීමට පළමු, 'අපි මෙසේ කරමු' යයි ඇති කර ගන්නා සම්මුතිය, දළ වශයෙන් **කතිකා** නමින් හැඳින්විය හැකි ය. එසේත් එහි අර්ථය ව්‍යවහාරයේ දී තව දුරටත් පැතිරී ගොස් සම්මුතිය යන අර්ථයටත් එසේ ම සාකච්ඡා කිරීම, ගිවිසුම හෝ පොරොන්දුව, තීරණය යන අර්ථවලටත් යෙදී ඇති සැටි පාළි යෙදුම්වලින් පෙනේ.

(I) **තේන ඛො පන සමයේන සාවත්ථියා සංඝේන කතිකා කතා හොති අන්තරා වස්සං න පබ්බාජේතබ්බන්ති'**[1]

එසමයෙහි 'වස්කාලය තුළ දී පැවිදි කරවීම නොකළ යුතු ය'යි සැවැත් නුවර සංඝයා විසින් කතිකාවත් කරන ලදී.

(II) **'මහාමහින්ද ථේරම්හි තං ඨානං සමුපාගතේ තං රචිතා එව නෙත්තු'න්ති කතිකඤ්චේව කාරයි.**[2]

මහා මහින්ද (ප්‍රතිමාව) එතැනට පැමිණ වූ කල්හි එය ඒ වීථියෙන් ම වැඩම කර විය යුතු යයි **කතිකා** කළ හ.

මේ පාඨවලින් හැඟවෙන ප්‍රකට අර්ථය සම්මුතිය යන්නයි.[3]

(III) **සම්බහුලා භික්ඛූ කෝසලේසු ජනපදේසු අද්ධානමග්ගපටිපන්නා හොන්ති. තේ කතිකං කත්වා සුසානං ඔක්කමිංසු පංසුකූලාය.**[4]

---

1. මහාවග්ග, සංස්. මෙතිකාවේ සද්ධාතිස්ස ථේර, පානදුර, 1930, 181 පි. (මව.).
2. මහාවංශ (උභය පූර්ණ සහිත), සංස්. පොල්වත්තේ බුද්ධදත්ත මහාථේර, 1959, 41. 30 (මවං.).
3. මේ අර්ථයට යෙදී ඇති තවත් නිදසුන් සඳහා බලන්න: මව. 306 පි; ජාතකට්ඨකථා, 2, සංස්. විදුරුපොල පියතිස්ස මහාථේර, කළුතර (කොළඹ), 1928,(වස්සජාතක), 315 පි. (ජාඅ.); සමන්තපාසාදිකා, 3, සංස්. වැලිවිටියේ සෝරත ථේර, කළුතර (කොළඹ), 1946, (චීවරක්ඛන්ධක), 844පි. (සපා.); මවං. 43.34; පාලිමුත්තක විනයවිනිච්ඡය, සංස්. පඤ්ඤාසාර, විමලධම්ම සහ අමරසේකර, ප්‍රකාශක ඒ කුරුප්පු, 1931, 232,234 පිටු (පාමුවිවි). විනයවිනිච්ඡය, සංස්. සිරිසුමනතිස්ස ස්ථවිර, ප්‍රකාශක, ඒ ඩී. සිල්වා සහ පී. ජී. මැන්දිස්, 1914, 2726, 2729 ගාථා (විවි).
4. මව. (චීවරක්ඛන්ධක), 340 පි.